12C1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023/06/15

පැමිණිලි පාර්ශවය : කේ.ජී.එන්.පී.කපුකොටුව,
අංක. 03, හල්ලොලුව,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පතිතුමිය,
මහ/මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.

02. විදුහල්පති,
මහ/ධර්මරාජ විද්‍යාලය,
මහනුවර.

( සභාපති, අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
මහ/මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර)

<u>පැමිණිලි අංකය - HRC/K/37/18/W</u>

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

ඉහත නම් දරණ පැමිණිලිකාර පාර්ශවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම දියණිය 2018 වර්ෂය සඳහා මහ/මහාමායා බාලිකා විද්‍යාලයට (1 ශ්‍රේණියට - සහෝදර පදනම යටතේ) ඇතුළත් කිරිමට ඉල්ලුම්පත් යොමු කොට සම්මුඛ පරික්ෂණය සඳහා පෙනී සිට එහිදි ලකුණු 36ක් උපයාගත් බවයි.

මෙහිදි සහෝදර පදනම යටතේ ලකුණු ප්‍රදානය කිරිමේදි මේ වන විට විද්‍යාලයේ ඉගෙනුම ලබන සහෝදරියට අදාළ විෂය සමාගමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම් හා ඇය විසින් පාසලට අත්කර දෙනු ලැබ ඇති ජයග්‍රහණ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නිර්ණායක වශයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සැළකිල්ලට භාජනය කෙරෙන බව පැමිණිලිකරු දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු තම වැඩිමහල් දියණියගේ ජයග්‍රහණයන්ට අදාළ සහතිකපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති නමුත් තම දියණිය විද්‍යාලීය බාලදක්ෂිකා සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක බව තහවුරු කරනු පිණිස ඇයගේ ශිෂ්‍ය වාර්තා පොත හැරුණු විට කිසිඳු සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් ඔහු සතුව නොමැති බවත්, සහෝදරියගේ විෂය බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු තහවුරු කෙරෙන එකී ශිෂ්‍ය වාර්තා පොතෙහි පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කෙරුණු බවත් ඊට අදාළව කිසිඳු ලකුණක් ප්‍රදානය නොකළ බවත් පැමිණිලි පාර්ශවය වැඩිදුරටත් දක්වා ඇත.

තවද සහෝදර පදනම යටතේ අයදුම්කරුවන් 25 දෙනෙකුගෙන් යුත් තාවකාලික ලේඛනයේ 25 වන ස්ථානයේ මෙම පැමිණිලිකරුගේ නම ඇතුළත්ව තිබුණු නමුත් උක්ත වතාවරණය යටතේ තම දියණිය විද්‍යාලයට ඇතුළත් කරගැනීම සම්බන්ධයෙන් අවධානම් තත්වයක් පැවැති බැවින් පැමිණිලිකරු අදාළ විෂයභාර ගුරුතුමියගේ උපදෙස් පරිදි විද්‍යාලීය නියෝජ්‍ය විදුහල්පතිතුමියගේ ද නිල මුද්‍රාව සහිත ලේඛනයක් අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එම ලේඛනයේ ඉතාමත් පැහැදිලි ලෙස පැමිණිලිකරුගේ වැඩිමහල් දියණිය වන කේ.ජී.එන්.ආකර්ෂා කපුකොටුව යන අය මහාමායා බාලිකා විද්‍යාලීය බාලදක්ෂිකා සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක වන බව සඳහන්ව පැවැති බවද දක්වා ඇත. එහෙත් එකී ලේඛනයද අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබූ බව දක්වා ඇත.

පැමිණිල්ලේ දැක්වෙන පරිදි ස්ථිර නාම ලේඛනයේ තෝරාගත් 25 දෙනාගේ නම් අතර මෙම පැමිණිලිකරුගේ නම අන්තර්ගත තිබී නොමැති අතර, එය පොරොත්තු ලේඛනයේ සඳහන්ව තිබූ බවත්, පොරොත්තු ලේඛනයේ හෝ නම ඇතුළත් නොවුණු අයදුම්කරුවකු අවසන් ලේඛනයේ මුලින් ම ඇතුළත්ව තිබෙන බවද පැමිණිලිකාර පාර්ශවය තවදුරටත් සැළකර ඇත. කුමන පදනමක් මත එසේ සිදුවූයේ ද යන්න තමන් හට ගැටළු සහගත බවත් තම දියණියට ඇගේ සහෝදරියගේ විෂය බාහිර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් (විද්‍යාලීය බාලදක්ෂිකා සංගමයේ ක්‍රියාකාරී සමාජිකාවක වශයෙන්) තොරතුරු තහවුරු කෙරෙන ලේඛනය සඳහා ලකුණු ප්‍රදානය නොකිරීම අසාධාරණ බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-**

පැමිණිලි පාර්ශවයේ උක්ත සැළ කිරිමට අනුව මෙම සිද්ධිය සම්බන්ධයෙන් කළ විමසීමට ප්‍රතිඋත්තර වශයෙන් වගඋත්තර පාර්ශවීය මහ/මහාමායා විද්‍යාලයේ විදුහල්පතිනියගේ 2018.02.22 දිනැති වාර්තාව මගින් පැමිණිලිකරුගේ ලකුණු ලබාගැනීම සම්බන්ධයෙන් පහත පරිදි කරුණු දක්වා ඇත

| නිර්ණායක | සම්මුඛ පරික්ෂණයේදී හිමි වූ ලකුණු | අභියාචනා හා විරෝධතා පරික්ෂණය |
|---|---|---|
| 01. සහෝදරිය ඉගෙනුම ලබන ශ්‍රේණිය | 04 | 04 |
| 02. පදිංචිය | 20 | 20 |
| 03. ආසන්නතාව තහවුරු කරන ලේඛන | 10 | 10 |
| 04. පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය | 00 | 00 |
| 05. සහෝදරියගේ ජයග්‍රහණ | 02 | 02 |
| මුළු ලකුණු ප්‍රමාණය | 36 | 36 |

ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය දක්වා ඇත්තේ, පැමිණිලිකරු විසින් අභියාචනා හා විරෝධතා පරික්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුණු විද්‍යාලයේ ඉගෙනුම ලබන වැඩිමහල් දියණිය බාලදක්ෂිකා සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක බව තහවුරු කෙරෙන ලේඛනය ඔහු විසින් මූලික සම්මුඛ පරික්ෂණය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බවයි. එසේ මූලික සම්මුඛ පරික්ෂණයේදී ඉදිරිපත් නොකෙරුණු ලේඛනයක් අභියාචනා හා විරෝධතා පරික්ෂණ මණ්ඩලය විසින් පසුව පිළිගැණුනහොත් එය 22/2017 චක්‍රලේඛනයේ 11.6 වගන්තියට පටහැනි වන බව වගඋත්තර පාර්ශවය තවදුරටත් පෙන්වා දී ඇත. එබැවින් අදාළ ලේඛනය අභියාචනා හා විරෝධතා පරික්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරුණද ඒ මත පැමිණිලිකරුට හිමි ලකුණු ප්‍රමාණයේ (36) සංශෝධනයක් සිදු නොවූ බවද දක්වා ඇත.

තවද පැමිණිලිකාර පාර්ශවය විසින් විරෝධතා පලකර සිටින එස් -12 අයදුම්කරුගේ නම තාවකාලික ලේඛනයෙහි අන්තර්ගත නොවූයේ අතපසුවීමකින් බවටත්, පසුව අභියාචනා හා විරෝධතා පරික්ෂණ මණ්ඩලය විසින් අදාළ ලිපිගොනු පරික්ෂා කිරීමෙන් අනතුරුව අවසාන නාම ලේඛනයට ඔහුගේ නම ඇතුළත් කළ බවටත් වගඋත්තරකාර පාර්ශවය තවදුරටත් කරුණු දක්වා ඇත.

මේ අනුව අයදුම්කරුගේ දියණියගේ නම තාවකාලික ලේඛනයේ 25 වන ස්ථානයේ සිට 2018 වර්ෂය සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේ අවසාන පොරොත්තු ලේඛනයේ පළමු ස්ථානයට පතවී ඇත. මෙම පදනම සඳහා කඩඉම් ලකුණු සීමාව ලකුණු 38 වූ බවත්, පැමිණිලි පාර්ශවයට හිමිව තිබූ ලකුණු 36 ඒ සඳහා සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් නොවූ බවත් වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් පෙන්වා දී ඇත.

**නිරික්ෂණය :-**

දෙපාර්ශවයේ ලිඛිත සැළකිරීම් සැළකිල්ලට ගනිමින් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් විමර්ශන පවත්වා ඇති අතර, එහිදි පහත කරුණු අනාවරණය වී ඇත.

එහිදී සහෝදරියගේ බාලදක්ෂිකා සංගමයේ සාමාජිකත්වය තහවුරු කෙරෙන ලේඛනය පිළිගත හැකි ලේඛනයක් ලෙස අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමන් විසින් පිළිගෙන ඇති අතර, මුල් අවස්ථාවේ විදුහල්පතිතුමියගේ අත්සන හා නිල මුද්‍රාව නොමැති වීමෙන් එය පිළිනොගත් බව දක්වා ඇත.

පැමිණිලිකාර කපුකොටුව මහතාගේ වැඩිමහල් දියණිය වන කේ.ජී.නෙත්මි ආකාර්ෂා කපුකොටුව මෙම විද්‍යාලයේ 7-ඒ ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර ඇය මෙම විද්‍යාලයේ බාලදක්ෂිකා ක්‍රියාකාරි සාමාජිකයෙක් බවට එම විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති සනාථ කර ඇත. ශිෂ්‍ය වාර්තා පොතෙහි මේ බව සඳහන් කර ඇති අතර, එය විදුහල්පතිනිය විසින් අත්සන් කිරිම හෝ ශිෂ්‍යාව විසින් අත්සන් කර ගැනිමට කටයුතු කිරීම දෙපාර්ශවයේම වගකිම වන බව නිරික්ෂණය වේ.

මෙම සහතික කිරිම නියෝජ්‍ය විදුහල්පති විසින් සිදුකර ඇති අතර, එය අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් කිරිමෙන් පසු සම්මුඛ පරික්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ ලේඛනයක් සේ නොසලකා සිටිම සාධාරණ නොවන්නේ එය වෙනත් බාහිර ආයතනයක් යොමු කළ ලේඛනයක් නොව මෙම විද්‍යාලය විසින්ම කළ සහතික කිරිමක් වන බැවිනි.

ඒ අනුව බාලදක්ෂිකා සංගමයේ සාමාජිකත්වය තහවුරු කෙරෙන ලේඛනය පිළිගත හැකි ලේඛනයක් ලෙස කොමිෂන් සභාව හමුවේදී අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමන් විසින් පිළිගත් බැවින් ඒ සඳහා හිමිවිය යුතු ලකුණු 2 ක් පැමිණිලිකරු වෙත හිමිවිය යුතු බව නිරික්ෂණය වේ. ඒ අනුව මෙම පැමිණිලිකාර අයදුම්කරුට හිමිවිය යුතු ලකුණු ප්‍රමාණය 38ක් වන බවත්, සහෝදර පදනම මත කඩඉම් ලකුණද ලකුණු 38 ක් වන බැවින් ඒ අනුව මෙම දරුවා මහ/මහාමායා බාලිකා විද්‍යාලයට ඇතුළත්වීමට සුදුසුකම් ලබන බවද නිරීක්ෂණය වේ.

සම්මුඛ පරික්ෂණයට පෙනී නොසිටි S-12 අයදුම්කරුගේ නම අතපසුවීමකින් තාවකාලික ලේඛනයේ ඇතුළත් කිරීමට නොහැකි වූ බව පවසන වගඋත්තරකාර පාර්ශවය එය සාධාරණීයකරණය කොට සහන සැළසීමට පියවර ගෙන ඇති නමුත් පැමිණිලි පාර්ශවීය දරුවා සම්බන්ධයෙන් එවැනි සාධාරණකරණය කිරීමකට උත්සහ ගත් බවක් නිරීක්ෂණය නොවේ.

පොරොත්තු ලේඛනයේ අංක 02 සහ 03 දරණ පිළිවෙලින් S-38 සහ S -39 දියණියන් මෙම පාසැලට ඇතුළත් කර ඇත්තේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේම නිර්දේශයකට අනුව බවද නිරීක්ෂණය වේ.

**නිගමන :-**

යථෝක්ත සියලු සැළකිරිම් සහ කරුණු දැක්විම් ද මූලික විමර්ශනයන්හීදි අනාවරණය වූ තොරතුරු ද අනුව, සහෝදර පදනම මත විද්‍යාලීය ප්‍රවේශය සඳහා අයදුම්කර ඇති මෙම අයදුම්කරු විසින් තම වැඩිමහල් දියණිය

විද්‍යාලීය බාලදක්ෂිකා සංගමයේ ක්‍රියාකාරී සාමාජිකාවක බව තහවුරු කිරීමට ඉදිරිපත් කළ නියෝජ්‍ය විදුහල්පතිතුමියගේ ද නිල මුද්‍රාව සහ අත්සන සහිත ලේඛනය පිළිගැනීමට හැකි වලංගු ලේඛනයක් බවත්,

ඒ අනුව එම ලේඛනය සම්බන්ධයෙන් සලකා බැලීමකින් තොරව වගඋත්තර පාර්ශවය විසින් ක්‍රියාකර ඇති බැවින් එමඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවීය දරුවා වන කේ.ජී.එම් ප්‍රභංගා කපුකොටුව දියණියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

**නිර්දේශය :-**

> ඒ අනුව වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවීය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකරුගේ දියණිය වන කේ.ජී.එම් ප්‍රභංගා කපුකොටුව දියණිය මහ/මහාමායා බාලිකා විද්‍යාලයේ නියමිත ශ්‍රේණියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 07 . 17 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
සභාපතිනි,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Justice Rohini Marasinghe
Judge of the Supreme Court (Retired)
Chairperson
Human Rights Commission of Sri Lanka

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත :- ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/